# බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව
# කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 14 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි මස 28 වැනි දින ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින්වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජංගම වගකීම් යටතේ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂය තුල එකතු කල අගය මත බදු වශයෙන් රු.329,555 ක හර ශේෂය ගෙවිය යුතු තැන්පත් වල බැර ශේෂයට හිලව් වීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) අතැති තොගයෙහි ඇතුළත් විදුලිය ගබඩා තොගයෙන් රු.33,704 ක් වටිනා විදුලිය භාන්ඩ තොග නිකුත් කර නොතිබුණද එම තොගය අවසාන තොගයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ ගෙවිය යුතු රු.352,052 ක මුදල 2015 ජනවාරි 23 දින ගෙවා තිබුණද මෙම වටිනාකම සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණය ගැති හා ණය හිමි ශේෂ වල දක්වා නොතිබුණි.

(ඈ) සභා අරමුදල් වැඩසටහන යටතේ 2014 අගෝස්තු 08 දින ණයහිමියන්ට ගෙවා තිබූ රු. 64,902 ක මුදල ගෙවිය යුතු ලෙස ණය හිමි ශේෂයේ ඇතුළත් කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ණයහිමි ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු කර්මාන්ත ණය ගැති උපලේඛනයෙහි ශේෂය වූ රු.103,060,750 ක වටිනාකමට ලැබිය යුතු කර්මාන්ත ණයගැති ලෙජර් ගිණුම සම කිරීම සඳහා රු.4,456,548 ක මුදලක් ලැබිය යුතු කර්මාන්ත ණයගැති ලෙජර් ගිණුම හර කොට සමුච්චිත අරමුදල බැර කර තිබුණි. මෙසේ වර්ෂය තුල කර්මාන්ත ආධාර වශයෙන් ලද මෙම මුදල හඳුනාගැනීමකින් තොරව ලෙජර් ගිණුමෙන් කපා හැර තිබුණි.

(ඊ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ස්ථාවර තැන්පත් පොළී වශයෙන් ලද රු.4,053,465 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(උ) ජල නළ එළීමේදී මාර්ග පලදු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද රු.1,329,612 ක මුදලක් එම මාර්ග පිළිසකර කිරීමක් නොකර සේවා සඳහා ගාස්තු ආදායම් යටතේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඹ) 2013 වර්ෂයේ පළාත් සභාවෙන් ලබා දී තිබූ රු.3,178,457 ක් වූ කැබ් රථය සඳහා වාරික වශයෙන් ගෙවන ලද වටිනාකම වූ රු.1,765,680 ක මුදල පමණක් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් වල සටහන් කළ යුතු වුවත් මුළු වටිනාකම ගිණුම්ගත වීම හේතුවෙන් රු.1,412,777 කින් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(එ) ඉහත වත්කමේ මුළු වටිනාකම වූ රු.3,178,457 ක මුදල අයකරගත හැකි උපයෝගී සේවා ගිණුම හර කර පළාත් සභා ණය ගිණුම බැරකල යුතු අතර එම ගිණුම් වලින් ගෙවන ලද මුළු වාරික මුදල වූ රු.1,765,680 ක වටිනාකම අඩුකල යුතුවේ. ඒ අනුව උපයෝගී සේවා ගිණුමේ හා පළාත් සභා ණය ගිණුමේ ශේෂය රු.1,412,777 ක් විය යුතු වුවත් උපයෝගී සේවා ගිණුමේ එය රු.3,178,456 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.1,765,679ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.24,733,708 ක් වූ ගිණුම් ශේෂ 7 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.22,362,074 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,295,262 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | | දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| ආදායම් විෂය | ඇස්තමේන්තුගත | තථ්‍ය | සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 3,666 | 3,367 | 2,846 |
| අක්කර බදු | 6 | -- | 28 |
| කර්මාන්ත බදු | 687 | 753 | 137 |
| ව්‍යාපාර බදු | 2,524 | 2,542 | 436 |
| වෙළඳ බලපත්‍රගාස්තු | 157 | 175 | 32 |
| බදුකර කුලී | 578 | 619 | 502 |
| විනෝද බදු | 30 | -- | - |
| කඩ කුලී | 722 | 687 | 226 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 6,326,484 |
| (ii) මුද්දර ගාස්තු | 30,351,039 |

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2006 වර්ෂයට පෙර සිට ඉදිරියට එමින් පවතින රු.1,455,576 ක් වූ හිඟ විශ්‍රාම වැටුප් දායකය 2014 දෙසැම්බර් 31 වන විටත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යවා නොතිබුණි.

(ආ) වර්ෂ 2 ඉක්මවා තිබූ රු.2,382,114 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් රජයේ මුදල් රෙගුලාසි 571 නියමය පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 හා 2007 වර්ෂයන් හිදි මාර්ග හානි වෙනුවෙන් තැන්පත් කර තිබූ රු.22,000 මුදල් අදාල කාර්යය කිරීමෙන් තොරව තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) ප්‍රමාණවත් ලෙස සභාව සතුව පුටු හා කූඩාරම් තිබියදී අවස්ථාවන් 5 කදී රු.152,500ක් වැය කර පුද්ගලික ආයතනයකින් කුලී පදනම මත කූඩාරම්, පුටු හා බල්බ ආදිය ලබාගෙන තිබුණි.

3.2 **<u>අවිධිමත් ගනුදෙනු</u>**

(අ) 2005 ජුනි 27 දිනැති අංක 1399/ 5 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ 4(අ) හි රීති අංක 3 පරිදි සභාපති, උපසභාපති හෝ සභිකයෙකු විසින් වෛද්‍ය හේතුවක් හැර සභාවේ අනුමැතිය මත නිවාඩු ලබා සිටීම දීමනා සඳහා හිමිකම් නොලැබුවද පැමිණීමේ ලේඛනයේ නොපැමිණි ලෙස සටහන් කර තිබූ සභිකයින් විසින් 2014 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සභික දීමනා වශයෙන් රු.231,500 ක් ලබාගෙන තිබුණි.

(ආ) 2000 ජුනි 02 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප) අංක LG /04/2000 දරන චක්‍රලේඛය අනුව සභාවේ සභාපතිගේ හා උපසභාපතිගේ දුරකථන බිල්පත් පියවීම සඳහා මාසික ගෙවීම් සීමාව පිළිවෙලින් රු.3,000 ක් හා 2,500 ක් වුවද එම සීමාවන් ඉක්ම වූ සභාපතිවරයාට රු.6,920 ක් හා උප සභාපතිවරයාට රු.10,612 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) සභාව සඳහා විවිධ වර්ණයෙන් යුතු කොඩි 200 ක් පිළියෙල කිරීම වෙනුවෙන් රු.158,800 ක් ගෙවා තිබුණි. මිල ගණන් 3 ක් කැඳවා තිබුණද කොඩි වර්ගය, කොඩියේ දිග, පළල සඳහන් කර නොතිබුණි. භාරගත් කොඩි ප්‍රමාණය, භාරගත් දිනය සටහන් කර නොතිබුණු අතර ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ද ඇතුළත් කර නොතිබුණි.

**3.3** <u>වාහන පාලනය</u>

(අ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර සභාව සතු සියලුම වාහන සම්බන්ධයෙන් මාස 6 කට වරක් ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි.

(ආ) 2014 අගෝස්තු 22 හා 2015 මාර්තු 02 යන දිනවල අනතුරු සිදු වූ වාහන 2 ක් සඳහා අළුත්වැඩියා වියදම් ලෙස රු.82,010 ක් වැය කර තිබුණද ඒ සම්බන්ධයෙන් රක්ෂණ වන්දි ලබාගෙන නොතිබුණි.

3.4 **<u>අයවැය පාලනය</u>**

I. 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව වැය විෂයන් 11 ක් සඳහා එකතුව රු.3,960,000 ක් වූ මුදලක් වෙන්කර තිබූ නමුත් වර්ෂය අවසානයට ඉන් කිසිඳු මුදලක් වැය කර නොතිබුණි.

II. වැය විෂයන් 13 ක් සඳහා එකතුව රු.5,670,000 ක ප්‍රතිපාදන අදාල කාර්යය ඉටු නොකිරීම හේතුවෙන්වෙනත්වැය විෂයන්ට මාරු කර තිබුණු අවස්ථාවන් නිරීක්ෂණය විය.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය